# හොඳම දේ දරුවන්ට !




**හො**ඳම දේ දරුවන්ට මේ ප්‍රකට කියමනකි. මේ අතර දරුවන් තරම් සම්පතක් තවත් නැහැ කොයි දේ කරන්නෙත් දරුවන් වෙනුවෙන් නේ යනුද නිතර ඇසෙන කියමන්ය.

සැබැවින්ම අද වෙන කවරදාටත් වඩා දෙමාපියෝ තම දරුවන් වෙනුවෙන් කාලය, ධනය, ශ්‍රමය නොමසුරුව කැපකරති. හැකිතාක් පෝෂ්‍යජනක ආහාර ඇඳුම් පැළඳුම් හා වෙනත් අවශ්‍යතාද සපයති. ඒ සියල්ලටම වඩා හොඳ අධ්‍යාපනයක් ලබාදීමට වෙහෙසෙති. එපමණක්ද නොව ඇති හැකි දෙමව්පියෝ තම දරුවන් වෙනුවෙන් මුදල් රැස්කිරීම් ඉඩකඩම් මිළදී ගැනීම් හා නිවාස තනාදීම පවා කරති.

මේ සියල්ල ඔවුන් විසින් කරනු ලබන්නේ හොඳ චේතනාවෙනි. ඒවායේ කිසිදු වරදක් අපි නොදකිමු. එහෙත් අප නොදකින, අප විසින් නොසලකා හරිනු ලැබ ඇති පැත්තක්ද ඇත. එනම් අපේ දරුවන්ට අනාගතයේදී ජීවත්වීමට ඇති පරිසරය අප විසින් ක්‍රමයෙන් විනාශකරනු ලබමින් තිබීමයි. ඔවුන්ට ජීවත්වීමට නුසුදුසු අහිතකර පරිසරයක් අපි මවමින් සිටින්නෙමු.

අනවසරයෙන් දැව කපා වනාන්තර විනාශකරන බලවන්ත දෙමාපියෝ තම දරුවන්ට ජීවත්වීම සඳහා කාන්තාර ඇතිකිරීමට කටයුතු කරති. ජලපෝෂක ප්‍රදේශවල වැස්ම ඉවත්කරන ඔව්හු අනාගතයේදී තම දරුවන්ගේ පවස සංසිඳුවා ගැන්මට ඇති ජල ප්‍රමාණයද නැතිකර දමති. තම දරුවන්ට හා ඔවුන්ගෙන් පැවතෙන්නනට කුසගින්න නිවාගැන්මට අවශ්‍ය ආහාර බෝග වගාකිරීමට ඇති සරු පස සෝදා පාලුවට ලක් කරති. කුඹුරු ඉඩම් ටිකද ගොඩකර දමති. වගා හා වෙනත් කටයුතු පහසුවෙන් හා ඉක්මනට කර ගැන්මට දරන උත්සාහය තුළින් විවිධ විෂ රසායනික ද්‍රව්‍ය පතුරුවා ඒවා ආහාර දාම ඔස්සේ තම දරුවන්ගේ ශරීර වලට ඇතුල් කරවති. පරිසර නීති රීති පවා කඩකරමින් මහා පරිමාණයේ කර්මාන්ත ශාලා පවත්වාගෙන යන ඇතැම් ධනවත් දෙමව්පියෝ තම දරුවන්ට ආශ්වාස කිරීමට ඇති වාතයද දූෂ්‍ය කරති.

අපි මේ කතාව අපේ රටට පමණක් සීමා නොකරමු. මුළු ලෝකයේම ඉන්නේ අපේම දරු-වන්ය. අපි සියල්ලෝම ඔවුන්ගේ දෙමව්පියෝ වෙමු. අපි සියල්ලෝ එකතුව අපේ දරුවන්ට ජීවත්වීමට ඇති මිහිතලයම විනාශකරමින් සිටිමු.

පොසිල ඉන්ධන දවමින් කාබන්ඩයොක්සයිඩ් වැනි හරිතාගාර වායු පිට කරමින් අපි මිහිතලය රත්කරමින් සිටිමු. ඒ මගින් මුදු ජලමට්ටම වැඩිකර පහත් බිම් ජලයෙන් යටකරමින්ද,

***මුළු ලෝකයේම ඉන්නේ අපේම දරුවන්ය. අපි සියල්ලෝම ඔවුන්ගේ දෙමව්පියෝ වෙමු. එහෙත් අපි සියල්ලෝ එකතුව අපේ දරුවන්ට ජීවත්වීමට ඇති මිහිතලයම විනාශකරමින් සිටින්නෙමු.***

ගංගාදිගේ කරදිය ගෙන්වමින් පානීය විනාශකරමින්ද, විවිධ කාලගුණ විපර්‍යාස ඇතිකරමින්ද සිටින්නෙමු. නොදැනුවත්වම වුවද මේ කාර්‍යයන් සියල්ලම සිදුවන්නේ අපේ දරුවන් වෙනුවෙන් ය.

පදිංචි නිවස හොඳ නැත්නම් අපේ දරු-වන්ට වෙනත් නිවසකට යා හැකිය. ගම හොඳ නැත්නම් ඔවුනට වෙනත් ගමකට යා හැකි ය. මෙරට හොඳ නැත්නම් ඔවුනට පිටරටකට යා හැකි ය.

එහෙත් මුළු ලෝකයම උණුසුම් වනවිට ඔවුන් යන්නේ කොයිබටද?

අපි අපේ දරුවන් ඇතුළු අනාගත පරම්පරාව රත්වන වතුර හැලියක පීනන කකුළුවන් බවට පත්කරමින් සිටිමු.

අපි අපේ දරුවන් ගැන සලකා කටයුතු කරන්නේ මේ ආකාරයට නම් ඔවුන්ට ඉතිරිව ඇත්තේ කාගේ පිහිටදැයි දැන් ඔබ මට කියන්න !

♦ ***විශ්‍රාමලත් විදුහල්පති***
***එස්. ජයසුන්දර***
**උඩුගම Sri Lanka**

# බලය මාරුවීම
## මෙහේ සහ එහේ

**මැ**තිවරණයකින් පසු පාලන බලය මාරුවීමේදී විවිධ මතභේද, අරගල, අර්බුද ඇතිවීම බොහෝ රටවල දක්නට ඇත. එවන් අර්බුද නිමවන්නේද තවත් අර්බුද රැසක් මතුකරමිනි. ප්‍රචණ්ඩ ක්‍රියා, සාපරාධී ක්‍රියා දේශපාලනයට එකතුවන්නේද මේ නිසා ය.

එහෙත් මෑතදී අවසන්වූ බ්‍රිතාන්‍ය මැතිවරණයෙන් පසුව රාජ්‍ය පාලන බලය මාරුවීමේ දී මෙහි දේශපාලන නායකයන් ක්‍රියා කළ ආකාරය කාටත් ආදර්ශයකි.

මැයි 6 වෙනි දින ඇතිවූ බ්‍රිතාන්‍ය මැතිවරණයේ අවසාන ප්‍රථිඵලය වූයේ කොන්සර්වේටිව් පක්ෂයට (Conservative ) ආසන 306 ක් ද, කම්කරු පක්ෂයට (Labour) ආසන 258 ක්ද, ලිබරල් ඩිමෝක්‍රැටික් පක්ෂයට (Lib-Dem) ආසන 57 ක්ද, අනෙත් පක්ෂ 27 ක්ද ගනිමිනි. ආසන 650 කින් සමන්විත බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ එක් ආසනයක් සඳහා ඡන්දයක් නොපැවැත්විණ. හේතුව මැතිවරණයට දින දහයකට පෙර එහි සිටි මන්ත්‍රීවරයා මියයාමයි. එයට වෙනම ඡන්දයක් මහ මැතිවරණයට පසුව පැවැත්විණ. තනි පක්ෂයකට පාලන බලය ලබාගැන්මට ආසන 325 ක්වත් අවශ්‍යය. මේ අනුව කිසිදු පක්ෂයකට තනිව ආණ්ඩුවක් පිහිටුවීමට නොහැකිවීය. ප්‍රධාන පක්ෂ දෙකම තුන්වැනි ප්‍රධාන පක්ෂය වූ ලිබ් ඩෙම් පක්ෂයට අත වැනුවේ සහාග රජයක් පිහිටුවීමටය. මේ සඳහා දින තුනක් පුරාම දිවා රාත්‍රි නොමැතිව විවිධ සාකච්ඡා ගණනාවක් පැවැත්විණ. මෙම සාකච්ඡාවලින් පෙන්නුම් කළේ කිසි-වෙකුත් තම පෞද්ගලික අභිලාෂයන් මත ක්‍රියා නොකොට හුදෙක්ම තම පක්ෂයෙහි ප්‍රතිපත්ති මතම සාකච්ඡා කළ බවයි. එසේ සහභාගිවූ පක්ෂ නායකයෝ තනිව තීරණවලට එළඹුණේ නැත. තම පක්ෂයේ ක්‍රියාකාරීන්ගේ අදහස්ද විමසූ වේය. විශේෂයෙන් ලිබ්ඩෙම් නායක නික් ක්ලෙග් සමහර තමා තෝරා පත් කළ ෂෙපීල්ඩ් ආසනයේ පක්ෂයේ ක්‍රියා කාරීන්ගේද අනුමැතිය පැතීය. ඕනෑම යහපත්, විනය ගරුක, ප්‍රජාතන්ත්‍රවාදී නායකයෙකුට තම දේශපාලන ප්‍රත්පත්ති තුනක් ඇත. එනම් ජාතික, ප්‍රදේශීය හා පෞද්ගලික වශයෙනි. මේ සෑම අංශයකින්ම සොයා බැලුවේ තම ප්‍රතිපත්ති කොතෙක් දුරට අනිකුත් පක්ෂයේ ප්‍රතිපත්ති සමග ගැලපෙනවාද යන්න පමණි. එහිදි කිසිවිටෙකත් කිසිවෙකු වරප්‍රසාද හෝ නිලතල හෝ ඉල්ලා සිටියේ නැත.

අවසානයේදී කොන්සර්වේටිව් පක්ෂය හ ලිබ්ඩෙම් පක්ෂය සහාග රජයක් පිහිටුවීමට තීරණය කළ අතර, දින 10 ක් ඇතුළත තමන්ගේ පක්ෂයේ විධායක මණ්ඩල සැසිවාරයක් පවත්වා අනුමැතිය ලබාගැන්මටද ඔව්හු කියා කළහ.

කම්කරු පක්ෂ නායක හිටපු අගමැති ගෝඩන් බ්‍රවුන් තම නිල නිවාසයෙන් එදිනම ඉවත්ව මහ රැජිණ හමුවී අගමැති ධුරයෙන් ඉල්ලා අස්විය. බකිංහැම් මාළිගයට ගිය



Gordon Brown



David Cameron

තම නිල රථයද, ආරක්ෂ කයින්ද ඉවත් කොට ආපසු ආවේ සාමාන්‍ය මන්ත්‍රීවරයෙකු ලෙස වෙනත් මෝටර් රථයකිනි. ඔහුට මහ මග කිසිවෙකු උද්ඝෝෂණය හෝ විරෝධතා දැක්වූයේ නැත. එසේම නව අගමැති තනතුරට පත් ඩේවිඩ් කැම රන් කිසි විටෙකත් ලේබර් රජයට දොස් නැගු වේ නැත. බ්‍රිතාන්‍යයේ පාලන බලය මාරු වූයේ එලෙසිනි.

ශ්‍රීලංකා වේ පාලනය මාරුවීමේදී හැමදාම ආරවුල්ය. පක්ෂ මාරු කොට එහාට මෙහාට පනින්නන් එමටය. අව ලාද නගන්නන් ගෙන් අඩුවක් නැත. පරාජය පිළිගෙන ගෙදර යන්න කැමැත්තක් ඇත්තේම නැත. පාලන බලය පමණක් නොව නිල නිවාස, යාන වාහන, ආරක්ෂක පිරිවර අත්හැරීමටද කල් මරති. ශ්‍රීලංකාවේ මැතිවරණයෙන් පරාජය වූ මැති ඇමතිවරුන් බොහෙ-ාමයක් තවම නිල නිවාස වල රැඳී සිටින බවටද වාර්තාවේ.



Nick Clegg

1965 ශ්‍රීලංකාවේ පාලන බලය එක්සත් ජාතික පක්ෂයට ලැබිණ. ශ්‍රීලංකා නිදහස් පක්ෂයෙන් තිස්සමහාරාම ආසනයට තේරී පත්වූයේ වාලි එදිරිසූරියයි. මැති සභාවේ පළමු දිනයේදීම ඔහු එක්සත් ජාතික පක්ෂයට එක් වූයේ සභා ගර්භය හරහා යමින් හස්ත සඬාවක් පා සිරිමා බණ්ඩාරනායක මැතිණියට කොකා පෙන් වමිනි. එනිසාම ඔහුට එදා සිට කොකා වාලි යන නම පටබැඳිණ. මෑතක ඔහු සුනාමියට හසුව මිය ගියේය.

මෙවර ද එක්සත් ජාත්ක පක්ෂයේ අබ්දුර් කාදර්, මනෝ ගනේෂන් වැනි මන්ත්‍රීවරු තම පක්ෂ ප්‍රතිපත්ති අමතක කොට රජයට සහාය පළකිරීමට තීරණය කර ඇත.

පාලනය අත්හැරීම මාරුකිරීම සහ ලබාගැනීම පිළිබඳව මහා බ්‍රිතාන්‍යය අප කාටත් ආදර්ශයකි.

♦ ***මේජර් වී. බී. කරුණාරත්න විසිනි***
**Major V. B. Karunaratne**
***Ex Deputy Sergeant-At-Arms in SL Parliament***
**Oxford - UK**

